# පුරප්පාඩු

## තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. <u>හෙද නිලධාරී II ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම,

සහ

(ආ) හෙදියක වශයෙන් ප්‍රවීණත්වය ලබා ඇති බවට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගත් හෙද ප්‍රවීණතා සහතිකය තිබීම

වැටුප් පරිමාණය: රු. 31,625 – 7x300;10 x355 – 37,275 (U- MT 1(IIIA)]මාසික

බඳවා ගනු ලබන ආකාරය: සම්මුඛ පරීක්ෂණයක් මගිනි

**02. <u>තාක්ෂණ නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) III ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

(අ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවක් යටතේ එකවර විෂයයන් 03ක් සමත්ව තිබීම,

සහ

(ආ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ තොරතුරු හා සන්නිවේදන සහ බහු මාධ්‍ය තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/තොරතුරු තාක්ෂණය හෝ සමාන ක්ෂේත්‍රයක් පිළිබඳ පිළිගත් ආයතනයකින් පිරිනමන ලද NVQ Level 5 ට නො අඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

සටහන: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පළපුරුද්දක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

වැටුප් පරිමාණය: රු. 31,625 – 7x300;10 x355 – 37,275 (U- MT 1(IIIA)]මාසික

03. <u>**විද්‍යාගාර සහායක III ශ්‍රේණිය**</u>

**අවශ්‍ය සුදුසුකම්**

i. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සම්මාන සාමාර්ථයන් දෙකක් ද (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

සහ

ii. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක් ප්‍රකාරව ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක්, හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද ප්‍රමිතිගත විද්‍යාගාර උපකරණ සහ විද්‍යාගාර ශිල්ප ක්‍රමවලට අදාල ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකමෙහි 2 හෝ 3 මට්ටම (NVQ Level 02 or 03) ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සටහන:** ප්‍රමිතිගත විද්‍යාගාර උපකරණ භාවිතය හා සැපයීම සම්බන්ධ දැනුම ලබා ගත හැකි සහ නවීන විද්‍යාගාර ශිල්පීය ක්‍රම ඉගෙන ගැනීමට අවස්ථාව පවතින උචිත තනතුරක අවම වශයෙන් මාස 06ක සේවා පළපුරුද්ද ජාතික වෘත්තීය සුදුසුකම් රාමුවේ 02 හෝ 03 මට්ටම (NVQ Level 02 or 03) ලෙස සැලකීමට හැකියාව ඇත.

වැටුප් පරිමාණය: රු. 28,025 – 16x270 – 32,345 (U- PL 2(III)]මාසික

බඳවා ගනු ලබන ආකාරය: යෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි

**04. <u>කම්මල්කරු II ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්**

i. කියවීමේ හා ලිවීමේ හැකියාව

ii. පහත සඳහන් කරුණු පිළිබඳ මනා හැකියාව.

(අ) දැල්වුම් පෑස්සුම්කරණය (fire welding) භාවිතයෙන් විවිධ ආකාරයේ සන්ධි සැකසීම,

(ආ) යකඩ අඩංගු ලෝහ සඳහා සිදුකරන විවිධ ආකාරයේ තාප පිරියම් ක්‍රම සහ ආශ්‍රිත පරීක්ෂණ,

(ඇ) වාත්තු වැඩ, දුනු වානේ රත් කිරීම හා ඒවා පණ පෙවීම,

(ඈ) කම්මල් කර්මාන්තය ආශ්‍රිත ආයුධ හා මෙවලම් භාවිතය පණ පෙවීම හා නඩත්තු කිරීම

iii. කම්මලක (Smithy Shop) වසර 02 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය: රු. 29,915 – 16x270 – 34,235 (U- PL 3(III)]මාසික

බඳවා ගනු ලබන ආකාරය: වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි

**05.** **<u>වාත්තුකරු II ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්**

i. ලිවීමට හා කියවීමට හැකියාව තිබිය යුතුය.

ii. මිලිමීටර් 1/1000 මෝස්තර තල භාවිතා කිරීමේ හැකියාව, වාත්තු වැඩ, වැලි මැලියම් සහ යකඩ මිශ්‍ර හා යකඩ අමිශ්‍ර ලෝහ හැඩ ගැන්වීමේ ක්‍රියාවලි, හර භාවිතය සහ එහි සංයුතිය, අලුව සහ හැඩමල හර භාවිතයෙන් තල හරයන් විවර්ථනය කිරීම (මධ්‍යම ප්‍රමාණයේ සැකිලි හර පෙට්ටි සහිත අච්චු මගින්), වැලි සහ තෙල් මිශ්‍රණ භාවිතයෙන් වාත්තුකරණය සඳහා හර මාර්ග පිළියෙල කර සැකසීම පිළිබඳ මනා දැනුමක් තිබීම.

iii. රජයේ දෙපාර්තමේන්තුවක රාජ්‍ය සංස්ථාවක හෝ ඉංජිනේරු ආයතනයක හර තනන්නෙකු (Core Maker) ලෙස වසර 2 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය: රු. 29,915 – 16x270 – 34,235 (U- PL 3(III)]මාසික

බඳවා ගනු ලබන ආකාරය: වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි

**06.** **<u>පෑස්සුම්කරු II ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්**

i. ලිවීමට හා කියවීමට හැකියාව තිබිය යුතුය.

ii. පහත දැක්වෙන කරුණු පිළිබඳ මනා හැකියාවක් තිබිය යුතුය.

(අ) මිලිමීටර් 1/100 පරිමාන නිවැරදිව කියවීමේ හැකියාව සහ සරල යාන්ත්‍රික ඉංජිනේරු ඇඳීමක් කියවා තේරුම් ගැනීම. පෑස්සීම සඳහා නොයෙකුත් වැඩ පිළියෙල කිරීමේ ක්‍රම, හේතු, අත් වැස්ම, පිරිපටි, මුළු පිළියෙල කර නිම කිරීම හා වෙනත් අන්දමේ පෑස්සුම්.

(ආ) විවිධ කොටස් සහ ද්‍රව්‍ය භාවිතයට ගන්නා ඉලෙක්ට්‍රෝඩ හා නොයෙකුත් ද්‍රව්‍ය සඳහා, විදුලි බල පාලනය, තිරස්, සිරස් හා ඉහළ මට්ටම් වල පෑස්සුම්,

(ඇ) ක්ලිප් කිරීම හා මනා නිමාවක් ලැබෙන සේ පිරවීම, ඇසිටලින් ජනකය නිවැරදිව භාවිතා කිරීම හා එහි පිරියත වල සුළු දෝශ හඳුනා ගැනීම හා ඒවා නිවැරදි කිරීමේ හැකියාව, වායු සිලින්ඩර් නිවැරදිව භාවිතා කිරීම පිළිබඳ දැනුම.

iii. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ ඉංජිනේරු ආයතනයක පෑස්සුම්කරුවෙකු ලෙස වසර 2කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය: රු. 29,915 – 16x270 – 34,235 (U- PL 3(III)]මාසික

බඳවා ගනු ලබන ආකාරය: වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි

**07.** **<u>යන්ත්‍ර ශිල්පි II ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්**

i. අවම වශයෙන් හත්වන ශ්‍රේණිය සමත් විය යුතුය.

ii. පහත දැක්වෙන කරුණු පිළිබඳ මනා හැකියාවක් තිබිය යුතුය.

(අ) මිලිමීටර් 1/1000 පරිමාන නිවැරදිව කියවීමේ හැකියාව සහ මයික්‍රොමීටරය අමාන භාවිතය.

(ආ) මෙම වෘත්තියට අදාල මෙවලම් හා ඒ සමග සම්බන්ධ කරන උපකරණ නම් වශයෙන් හැඳිනීම සහ ඒවායේ භාවිතය සහ නඩත්තු කිරීමේ හැකියාව.

(ඇ) රාජකාරියට අදාල සියළුම සැලසුම් කියවීමේ හා අවබෝධ කර ගැනීමේ හැකියාව.

(ඈ) වැද්දුම් පට්ටලය, හැඩගාන යන්ත්‍රය, නිමයුම් යන්ත්‍ර, ලියවන පට්ටලය යන්ත්‍ර ආදී ක්ෂේත්‍රයන්ගේ යන්ත්‍ර ඉතා වෘත්තීමය ලෙස ක්‍රියා කිරීමේ හැකියාව.

iii. රජයේ කර්මාන්ත ශාලාවක වසර 2කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය: රු. 29,915 – 16x270 – 34,235 (U- PL 3(III)]මාසික

බඳවා ගනු ලබන ආකාරය: වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි

**08.** **<u>මෝටර් කාර්මික II ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්**

i. ලිවීමට හා කියවීමට හැකියාව තිබිය යුතුය.

ii. පහත ක්ෂේත්‍ර පිළිබඳ මනා දැනුමක් හා හැකියාව තිබිය යුතුය.

(අ) එන්ජිමක විවිධ කොටස් සම්බන්ධයෙන් පැහැදිලි දැනුම සහ වැසි බෙයාරිං එක්රැස් කිරීම, රෝද පරතරය (alignment) පිරික්සීම.

(ආ) විදුලි සම්ප්‍රේෂණ පද්ධතිය, ධාවනයේදී පැට්‍රෝල් හා ඩීසල් එන්ජින් දෙවර්ගයේම ධාවන දෝෂ ඉක්මණින් හා නිවැරදිව සොයා ගැනීම සහ එම දෝෂයන් නිවැරදි කිරීම

**සහ**

(ඇ) අදාල ඉන්ධන පද්ධතිය හා සම්බන්ධ වායු විමෝචනය සහ ද්‍රවසීකර යන්ත්‍ර සහ පොම්ප සකස් කිරීම පිළිබඳව දැනුමක් තිබීම.

iii. රජයේ දෙපාර්තමේන්තුවක රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් මෝටර් ඉංජිනේරු ආයතනයක මෝටර් කාර්මිකයෙකු ලෙස වසර 2කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය: රු. 29,915 – 16x270 – 34,235 (U- PL 3(III)]මාසික

බඳවා ගනු ලබන ආකාරය: වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි

<u>**සටහන:**</u>

**i.** **ඉහත සඳහන් සියළු තනතුරු සඳහා මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව රු. 17,800/- අතිරේක මාසික දීමනාව (20%) හා මාසික අන්තර් දීමනාව (45%) ද ගෙවනු ලැබේ.**

**ii.** **අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය**

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය**

විස්තර සහිත දැන්වීම සහ අයදුම්පත් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියට (***http://www.itum.mrt.ac.lk)*** පිවිසීමෙන් බාගත හැක. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාල සහතික වල පිටපත් සමඟ 2024.10.21 දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් <u>**නියෝජ්‍ය ලේඛකාධිකාරී, තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, දියගම, හෝමාගම**</u> යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ අදාල තනතුර සඳහන් කල යුතුය.

රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙන යම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කල විට කුමන හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.

**අධ්‍යක්ෂ,**
**තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය**
2024.09.30